# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 සැප්තැම්බර් 03 වන අඟහරුවාදා**
2013 செப்டெம்பர் 03 செவ்வாய்க்கிழமை
Tuesday 03rd September 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.46 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.46 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.46 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர்[ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

***කාරක සභා වාර්තා නිවැරැදි කිරීම් :***

*2013.08.19 දින මෙම සභාවට පිළිගන්වන ලද 2013.07.23 දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභා රැස්වීම් වාර්තාවේ, "පානදුර ප්‍රාදේශීය සභාව" යනුවෙන් සඳහන් සියලු තැන් "පානදුර නගර සභාව" යනුවෙන් ද, "පානදුර ප්‍රාදේශීය සභාවේ" යනුවෙන් සඳහන් සියලු තැන් "පානදුර නගර සභාවේ" යනුවෙන් ද නිවැරදි විය යුතු බව කාරුණිකව දැනුම් දෙනවා.*

*එම නිවැරදි කිරීම් ඇතුළත් කර, භාෂාත්‍රයෙන්ම සකස් කරන ලද එම වාර්තාවේ පිටපත්, අද දිනට නියමිත සභා න්‍යාය පත්‍රය සමගම සියලුම ගරු මන්ත්‍රීවරුන්ට තැපැල් මගින් ලැබෙන්නට සලස්වා ඇති බව ද කාරුණිකව දැනුම් දෙනවා. "*

*ii*

*"උතුරු පළාත් සභාවේ ජ්‍යෙෂ්ට නිලධාරීන් කණ්ඩායමක් මෙම පළාත් සභාවේ කටයුතු පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා අද දින මෙහි පැමිණීමට අවසර ඉල්ලා ඇති බවත්, මගේ නියමයෙන් මේ අවස්ථාවේදී සභා ගර්භයේ අසුන්ගෙන සිටින බවත් දැනුම් දෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම අමාත්‍යවරු සහ ගරු මන්ත්‍රීවරු වෙනුවෙන් මම ඒ සියලු දෙනාම පිළිගනු ලබනවා."*

*iii*

*"2013.09.17 දිනට සභා රැස්වීමක් නොපවත්වා ඒ වෙනුවට 2013.09.24 දින සභා රැස්වීම පැවැත්වීම වඩාත් සුදුසු බව පසුගිය සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එකඟතාවයක් පළ වුණි. ඒ සම්බන්ධව නිශ්චිත තීරණයක් අද දින න්‍යාය පත්‍රයේ සභාවේ කටයුතු නමින් සඳහන් විෂයයට එළඹුන විටදී ගරු මන්ත්‍රීවරුන්ගෙන් බලාපොරොත්තු වන බව මෙලෙස පූර්ව දැනුම් දීමක් කරනවා."*

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා වාර්තා මම පිළිගන්වනවා.

i. 2013.07.31 වන දින පැවති මහජන පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව.

ii. 2013.08.19 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු මහින්ද කුරුවිටගේ**
Hon. Mahinda Kuruwitage

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම මම ඉදිරිපත් කරනවා.

i. කෝට්ටේ, ඇතුල් කෝට්ටේ, උස්වත්ත මාවත, අංක 92 හි පදිංචි රජිව් ද සිල්වා යන අයගෙන් පෙත්සම සහ

ii. ඇතුල් කෝට්ටේ, මල් පාර, අංක 883/21 හි පදිංචි ඩී.ඇස්. ඒකනායක යන අයගේ පෙත්සම.

***[සභා මේසය මත තබන ලද පෙත්සම]**
*[Tabled pettion]*

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ අත්සනින් යුත්,

බොරලැස්ගමුව, වේරහැර, ගංගාරාම පාර, ජයන්ති පෙදෙස, අංක 33 A හි පදිංචි ඒ.පී.ඒ. කාරියවසම් යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගේ නමින් යුත් පළමු ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

ඒ සඳහා පිළිතුරු දීමට සති 02 ක කාලයක් ඉල්ලනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මීට ඉස්සෙල්ලා සති 03 ක් ඉල්ල ගත්තා. පොඩ්ඩක් ඉක්මණට උත්තරයක් දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා ඔබතුමා ඒ ප්‍රශ්නවලට ඉක්මණින් පිළිතුරු ලබා දෙන්න කටයුතු කරන්න.

***ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*Hon. Chairman ordered by to refer the question to the next Council sitting.*

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු මොහොමඩ් මුජිබූර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, කාලය ලබා දීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා. අපි දන්නවා, පසුගිය කාලය පුරාම මේ රටේ යම් යම් සංවිධාන මේ රට තුළ විශාල මුස්ලිම් විරෝධී ක්‍රියාදාමයක් හා සිංහල - මුස්ලිම් ජනයා අතර ගැටුම් ඇති කිරීමේ ක්‍රියාවලියක යෙදිලා ඉන්න බව. ඔවුන්ගේ ඒ ක්‍රියා කලාපයන් සමහර මුස්ලිම් ජනතාවගේ සමහර යම් යම් අයිතීන් වෙනුවෙනුත් ඒවා අද වන කොට බලපාලා තිබෙන බව අපි දන්නවා. ඒවා නවත්වා ගන්නත් බැරි තත්ත්වයක් අද උදා වෙලා තිබෙනවා. නමුත් ඒ ක්‍රියා කලාපය උඩ, ඔවුන්ගේ මතවාද, ඒ අදහස් උඩ අද සමාජය තුළට බොහොම සීඝ්‍රයෙන් මේ ජාතීන් අතර තිබෙන සමඟිය කඩලා, ජාතීන් අතර සැකය, වෛරය, ඒ වාගේ දේවල් ඇති කරලා, එකිනෙකා අතර ගැටුම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය දිගටම සිද්ධ වී ගෙන යනවා. එතකොට අද එම සංවිධානවල ක්‍රියාදාමය හා ඔවුන්ගේ ක්‍රියා කලාපයන් උඩ අද මුළු සමාජය තුළටම ඒ ජාතිවාදී අදහස්, වෛරය හා ඒවා පැතිරවීමේ ක්‍රියාදාමයක් හැටියට තමයි මේවා ක්‍රියාත්මක වෙන්නේ. අද ඔවුන්ගේ ඒ ජාතිවාදී අදහස් සමාජයේ ඉතාම පහළ මට්ටමට පවා ගලාගෙන ගිහිල්ලා තිබෙනවා. අපි දන්නවා, අද සමහර පාසල්වලට පවා, බස්නාහිර පළාතේ පාසල් තුළ පවා යම් යම් සිදුවීම් සිද්ධ වෙලා තිබෙනවා. ඒ ඔවුන්ගේ අදහස් ඒ පාසල්වල ඉගෙන ගන්න ළමයින්ගේ ඔළුවට දැමීම තුළින් ඒ විෂ බීජ නිසා ඒ පාසල් තුළ ඉගෙනා ගන්නා විවිධ ජන කොටස් අතර, ඒ ජාතීන් නියෝජනය කරන ළමයින් අතර පවා අද ගැටුම් නිර්මාණය වන තත්ත්වයකට මේක ඉතාම බරපතළ විධියට මේ සමාජය ඇතුළට අද කාවැදිලා තිබෙනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, ඒ අදහස් අපි නොදන්නවා වුණාට අද රජයේ ආයතන තුළත් ඒවා කිඳා බැහැලා තිබෙනවා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට තමයි පළාත් පාලන ආයතනවල නියෝජනය කරන, රජයේ පාලනය ඇති සමහර ආයතන, ඒ සංවිධානවල නියෝජිතයෝ හැටියට ඒ සංවිධානවල අනුදැනුම ඇතිව, ඔවුන්ගේ යෝජනා ක්‍රියාත්මක කරන සභාවල් බවට පත් වෙලා තියෙනවා. අද ඔවුන් සභාවලට යෝජනා ගෙනැල්ලා තිබෙනවා. එතකොට මේ ගවමස් කෑම, අපේ බස්නාහිර පළාත තුළ තිබෙන කොට්ටාවත්ත ප්‍රාදේශීය සභාව, ඒ වාගේම පානදුර ප්‍රාදේශීය සභාව වාගේ ප්‍රාදේශීය සභාවල් ඒවා පවත්වාගෙන යන්න ඉදිරියේදී ඔවුන් ලයිසන් නිකුත් කරන්නේ නැහැයි කියලා යෝජනා සම්මත කර ගෙන තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ගවමස් කෑම කියන එක, මුස්ලිම් ජාතිකයන් අතර විශේෂයෙන්ම වෙළඳ ව්‍යාපාරයක් හැටියට තමයි මෙය පවත්වන්නේ. නමුත් අද ඒක කර්මාන්තයක් දක්වා විහිදිලා තිබෙනවා. අද ඒකෙන් ජීවත් වන විශාල පවුල් පිරිසක් මේ රටේ ඉන්නවා. මොකද, අද ඒ තිබෙන වෙළඳ අධිකාරියට විරුද්ධව, මුස්ලිම් ජාතිකයන්ගේ අතේ තිබෙන මේ වෙළඳාමට විරුද්ධව තමයි අද මේ මතවාදය එන්නේ. එහෙම නැතිව ගවමස් කෑම තහනම් කළ යුතුයි කියලා කියනවා නම්, මම නම් එකඟයි. එහෙම නම් සියලුම මස් වර්ග කන එක තහනම් කරන්න ඕනෑ. එහෙම නම් අපි වෙජිටේරියන් විතරක් වෙමු. අපි මේ රටේ එළවළු විතරක් කමු. ඒකට මමත් එකඟයි. එහෙම නැතිව මේ හරක් මස් කන එකට විරුද්ධ වෙනවාය කියලා කියන්නේ, මුස්ලිම් ජනතාවට විරුද්ධව එන එකක්.

ගරු සභාපතිතුමනි, බෞද්ධ දර්ශනය ගැනත් අපි සියලු දෙනාම දන්නවා. බුදු හාමුදුරුවෝ පවා දේශනා කරලා තිබෙන්නේ, සියලු සත්වයෝ කියලා. එතකොට හරක් මස් විතරක් කනවාට විරුද්ධයි කියලා කියනවා කියන්නේ, ඒක පිටිපස්සේ වෙනම දේශපාලන මතවාදයක් තිබෙනවා. එතකොට ඒක අද පළාත් පාලන ආයතන තුළටත්, බස්නාහිර පළාතේ සමහර පළාත් පාලන ආයතන තුළටත් - අන්තවාදය සහ ජාතිවාදය අවුස්සන සමහර සංවිධානවල නියෝජිතයෝ හැටියට අද ඔවුන් ඒ පළාත් පාලන ආයතනවලට යෝජනා ගේනවා. ඒ නිසා මම ඔබතුමා මාර්ගයෙන් අපේ මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, වහාම ඒ පළාත් පාලන ආයතන තුළ ජීවත් වන අනෙකුත් ජන කොටස්වල ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කරන්න, ඔවුන්ගේ අනන්‍යතාවයන් ආරක්ෂා කරන්න මේ බස්නාහිර පළාත් සභාව යටතේ තිබෙන ඒ පළාත් පාලන ආයතනවලට උපදෙස් දෙසන ලෙසත් හා ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ග ගැන මේ සභාවට පැහැදිලි කිරීමක් කරන්නය කියලාත් ඉල්ලා සිටිනවා. ස්තූතියි.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මෙම අදහස මතු කරන්නට අවස්ථාවක් ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන්ම ස්තූතිවන්ත වෙනවා. පසුගිය දවස්වල දිගින් දිගටම මාධ්‍ය ඔස්සේ සාකච්ඡාවට බඳුන් වුණු කරුණක් තමයි කොළඹ මහ නගර සභාවේ ලිපි ගොනු 6000 ක් බොරැල්ල කනත්තේදී පුච්චලා දාලා විනාශ කරලා තිබීම, අදාහානය කරලා තිබීම -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මිහිදන් කරලා -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මිහිදන් කරලා නොවෙයි.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මිහිදන් කරලා නොවෙයි. මිහිදන් කරනවා කියන්නේ වළලනවා කියන එකට. ආදාහනය කරලා තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

දෙකම එකයි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නැහැ. නැහැ. දෙකම දෙකක්.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ආදාහනය කළාට පුච්චලා නැහැ නේ?

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

කොළඹ මහ නගර සභාව එක්සත් ජාතික පක්ෂයේ නේද?

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔව්. ඒක තමයි කියන්නේ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

කොමසාරිස් ඔබතුමන්ලාගෙනේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ආණ්ඩුවේ කොමසාරිස්.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

බලය තිබෙන්නේ නගරාධිපතිට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා. එතුමාට විනාඩි 04 ක කාලයක් පමණයි තිබෙන්නේ. පෞද්ගලික පැහැදිලි කිරීම්වලට බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා, ඔබතුමාගේ ප්‍රකාශය කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම හිතන්නේ රාජ්‍ය කාර්යාලයක හෝ වෙනත් ආයතනයක ලිපි ගොනු පිළිස්සීමේ, විනාශ කිරීමේ ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදයට අනුව ලිපි ගොනු ඉවත් කිරීම, එහෙම නැත්නම් පිළිස්සීම සඳහා අවසර අරගෙන තිබෙන්නේ, කොළඹ මහ නගර සභාවේ තිබෙන ආරංචිය හැටියට ලිපිගොනු 630 කට. නමුත් ලිපිගොනු 630 කට අවසරය ගත්තත් ලිපිගොනු 6000 ක් දක්වා පුච්චලා තිබෙනවා. ඒ නිසා මේක දිගින් දිගට රටේ ප්‍රශ්නයක් බවට, මහ නගර සභාව තුළ ප්‍රශ්නයක් බවට පත්වෙලා තියෙනවා. ඇයි? මෙහෙම අනවසර විධියට මෙය පුච්චන්නේ කියන එක ජනතාව අතර කථිකාවතක් මතු වෙමින් තිබෙනවා. ඒක කොයිතරම්ද කියලා කියනවා නම්, කොළඹ මහ නගර සභාවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු පමණක් නොවෙයි. රජයට සම්බන්ධ මහ නගර සභාවේ ඉන්න මන්ත්‍රීවරු පස් දෙනෙක් හැර මේ ලිපි ගොනු පිච්චීමේ සිද්ධිය පිළිබඳව විධිමත් ස්වාධීන පරීක්ෂණයක් කරන්නට ඕනෑ කියනවා. ඒ නිසා මේ පිළිබඳව විශේෂයෙන්ම පළාත් සභාව පිළිබඳව විශ්වාසයක් තියලා තිබෙනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමා හරහා මේ කටයුත්ත නිසි විධියට කෙරෙයි කියලා තමයි කොළඹ මහ නගර සභාවේ රැස්වීමේදී මේ තීන්දු තීරණ අරගෙන තිබෙන්නේ. ඒ නිසා අපි දන්නවා, මේ කොළඹ මහ නගර සභාවේ මේ ලිපි ගොනු සම්බන්ධව දැනට කථා වෙන්නේ වෙන මොකුත් නොවෙයි. මේ ඉන්න නාගරික කොමසාරිස්වරිය තමන්ගේ කොමසාරිස්වරයෙකුගේ පාලනය යටතේ තිබෙන කාලයේදී තමන්ට ඕනෑ විධියට, කොමසාරිස්වරයාට ඕනෑ විධියට විවිධ වැඩ කටයුතු නිසි පරිදි, විධිමත් නොවන ආකාරයට පත්වීම් දීම ආදී විවිධ කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා ඒක කොයිතරම්ද කියලා කියනවා නම්, මේ තත්ත්වය නගර සභාවේ පැවැත්මට ඉතාම හානිදායක වෙමින් යනවා. ඒ නිසා මේ පිළිබඳව විධිමත් වූ පරීක්ෂණයක් කරන්නට ඕනෑය කියන එක කොළඹ මහ නගර සභාවේ ඉන්න නාගරික මන්ත්‍රීවරුන්ම මේ වනකොට ප්‍රකාශ කරලා තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ ඉන්න නාගරික මන්ත්‍රීවරු. ඒ නිසා අපි ඔබතුමා මාර්ගයෙන් මතක් කරනවා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට. මේ පිළිබඳව විශාල වගකීමක් මෙතුමාට තිබෙනවා. මේ වන විට අපි පුවත්පත්වලින්, ඒ වාගේම මාධ්‍ය වලින් දැකලා තිබෙනවා, මේ කාරණය සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව පරීක්ෂණයක් කරන්න අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා කියන එක. මම සොයා බැලීමේදී කොළඹ මහ නගර සභාවට පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ගිහිල්ලා තිබෙන බව අපට දැනගන්නට ලැබිලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, තමන්ට කොයිතරම් බලයක් තිබුණත් මේ බලය වැරැදි විධියට පාවිච්චි කරන්න නිලධාරීන්ට පුළුවන්කමක් තිබෙනවා නම්, මේක ඉතාම අශෝභන සිද්ධියක් බවට, වැරැදි සහගත සිද්ධියක් බවට පත් වෙනවා. ඒ නිසයි අපි මතක් කරන්නේ, මේ සඳහා ස්වාධීනව වැඩ කටයුතු කරන්න පුළුවන් විධිමත් ක්‍රියා මාර්ගයක් ගන්නට ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අපි යෝජනා කරනවා. අද පරීක්ෂණයක් කරනවාලු. හැබැයි, ඒ සම්බන්ධව චෝදනාව ලබපු අදාළ කොමසාරිස්වරිය ඒ තනතුරේම ඉඳගෙන. මම හිතන්නේ මේ සම්බන්ධයෙන් මීට වඩා පුළුල් තැනකට -

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ පිළිතුරු දිය නොහැකි පුද්ගලයෙකුට සභාවේ විවේචනය කිරීමට ඉඩදෙන්නට පුළුවන්කමක් නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ. නැහැ. එහෙම ප්‍රශ්නයක් නැහැ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු විපක්ෂ නායකතුමා, පොඩ්ඩක් ඉඩ දෙන්න. තව චෝදනාවක් විතරයි. ඉවත් කිරීම සඳහා පරීක්ෂණයක් පවත්වලා වැරැදිකාරයෙක් වෙන්න ඕනෑ. එහෙම නැතිව මේ විපක්ෂ නායකවරයා - කොළඹ නගර සභාවේ එක්සත් ජාතික පක්ෂ පාලනයක් තිබෙන්නේ. මේ අපේ පාලනයක් නොවෙයි. ඒක ඒ අයගේ දුර්වලතාවයක් වහගන්න මේ-

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක තමයි අපි කියන්නේ, ගරු සභාපතිතුමනි.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මිනිස්සුන්ට එහෙම චෝදනා කරන එක වැරැදියි.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, කොළඹ නගර සභාව තිබෙන්නේ -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඔබතුමා තීන්දුවක් ගන්න. නිලධාරියෙකුට මෙතැන සභාවේ උත්තර දෙන්න බැහැ නේ?

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

එක්සත් ජාතික පක්ෂ පාලනයේ දුර්වලතාවය වහගන්න කරන ප්‍රකාශයක් මේක.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

සභාවේ රීති අනුව ඔබතුමා කටයුතු කරන්න. නිලධාරියෙකුට සභාවේ උත්තර දෙන්න බැහැ. චෝදනාවක් විතරයි. වැරැදිකාරයෙක් කියලා ඉවත් කළේ නැහැයි කියලා චෝදනා කරන්නේ කොහොමද?

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මොකක්ද මේ හැමවේලාවේම මෙතුමා හැම දෙයකටම පනිනවා. කට ගහනවා. මොලේ විකාරයෙන්, විනයක් නැතිව මෙතුමා කථා කරනවා. මොකද, අපට කථා කරන්න බැරි? එතුමාට විතරයි මේ රටේ ඉන්න ඕනෑ මිනිහෙකුගේ නම් කියන්න පුළුවන්කම තිබෙන්නේ. වෙන එක මිනිහෙකුට බැහැ. මේක මාර තත්ත්වයක්.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

බැහැ. බැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේක මාර තත්ත්වයක්. තමුන්නාන්සේගේ කට තිබුණට නිකන් කට වහගෙන ඉන්න. විනයක් නැති මිනිහෙක් විධියට හැසිරෙන්නේ නැතිව. මේ සභාවේ තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු සියලුදෙනාගේම ගෞරවය ආරක්ෂා කරගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

සභාවේ රීති පිළිබඳව අවබෝධයක් නැහැ. මුට්ටි අල්ලලා නායකකන් ගත්තාට විපක්ෂ නායකතුමාට රීති පිළිබඳ අවබෝධයක් නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සංවිධායකතුමා, එතුමාට බාධා කිරීම් කරන්න එපා. කරුණාකර වාඩි වෙන්න. ගරු විපක්ෂ නායකතුමා ඔබතුමා නිලධාරීන් සම්බන්ධව කථා කරන්න යෑම -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එහෙමනම් මේ සභාවේ කිසිම නිලධාරියෙකුගේ තනතුරක් නොකියා කථා කරන්න - එතුමා කොපමණ කල් පසුගිය කාලයේ මේ සමූපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට විරුද්ධව මේක ඇතුළේ කථා කළාද? එතුමාට විතරයි ඔක්කෝම පුළුවන්. අනික් අයට බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා, අනවශ්‍ය විවාදවලට ඔබතුමා යන්න එපා. ඔබතුමාගේ ප්‍රකාශය -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

තමුන්නාන්සේ කියනවා නම්, එක්සත් ජාතික පක්ෂයේ පාලනයක් තිබෙන්නේ කියලා. අපට ඕනෑ එක්සත් ජාතික පක්ෂය පාලනය යටතේ තිබෙන නගර සභාව නිවැරැදිව වැඩ කටයුතු කළාද කියන එක දැනගන්න. එහෙමනම් ඒකේ අයිතිය අපට නැද්ද?

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

තිබෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඉතින් එහෙමනම්, ඔබතුමා මොකටද දත කට පූට්ටු වෙලා දඟලන්නේ? මේ නිකන් අමුඩේ ගහගෙන කෑ නොගහා ඉන්න අනේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාගේ කාලයත් දැන් අවසන්.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

කොළඹ නගර සභාවේ Parking ටික බදු අරගෙන තිබෙන්නේ මෙතුමාගේ අයියා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔව්. කොළඹ නගර සභාවේ ඔක්කොම Parking ටික බදු අරගෙන තිබෙන්නේ මෙතුමාගේ අයියා. ඒ කොමසාරිස් කාලයේ මෙතුමාගේ අයියා ගත්තා. කොමසාරිස්ට බලය තිබෙන කාලයේ අයියා මේවා වැරැදි විදියට ගත්තා. ඔබතුමා දන්නේ නැතිව ඇති.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

[සභාවේ ඝෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, කොමසාරිස්ට බලය තිබෙන කාලයේ අයියට කොළඹ නගර සභාවේ Parking ටික ඔක්කොම අරගෙන දුන්නා. ඒවා තමයි පුච්චලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා. කථාව අවසන් කරන්න. කාලය ඉවරයි.

[සභාවේ ඝෝෂා]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ටෙන්ඩර් නැතුව දුන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ටෙන්ඩර් නැතිව ගත්තේ.

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

පරීක්ෂණයක් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

පරීක්ෂණ කරන්න හදන කොට තමයි ලිපිගොනු පුච්චන්නේ. ඒක තමයි හේතුව. අයියාව බේරගන්න. අයියාව බේරගත්තේ නැත්නම් මල්ලිගේ හම යනවා. ඒකයි මේ කෑ ගහන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා. කරුණාකර වාඩි වෙන්න. ඔබතුමාගේ කාලය අවසන්. අවසන් කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, අපි කියන්නේ, ඒ නිසා මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කරන්නට ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කාලය ගොඩක් වැඩියෙන් ගත්තා. ඒ නිසා කරුණාකර වාඩි වෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තවදුරටත් මට ඔබතුමාට කාලය දෙන්න අමාරුයි.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මගේ කාලය කෑවේ අරයා නේ ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය අවසන්. ඔබතුමා ගොඩක් කථා කළා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් මේ පිළිබඳව ඉල්ලීමක් කරනවා, මේ පිළිබඳව සොයා බලලා නිසි කටයුතු කරන්නය කියලා. අපි මෙපමණ කල් කනත්ත පාවිච්චි කරලා තිබෙන්නේ, මිනී පුච්චන්න. එහෙම නැත්නම් පස් යට ඒවා වළලන්න. අද කොළඹ නගර සභාවේ කනත්ත පාවිච්චි කරන්නේ, දූෂණ පුච්චන්න. දූෂණ යටපත් කරන්න කියන එක මතක් කරමින්, මට මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු සභාපතිතුමනි, පසුගිය 25 වනදා සිට රට තුළ එළි දක්වන ලද, රඟ දක්වන ලද පිල්ලේ සහ ආණ්ඩුව නාටකය තවමත් එලෙසම ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ගරු සභාපතිතුමනි, මේ නාටකයේ විවිධ නළුවෝ හිටියා. පිල්ලේ නෝනාගේ කකුල් දෙක අස්සේ දැවැටෙමින් පුරු පුරු ගාන බලලාගේ සිට පිල්ලේ නෝනාට අභියෝග කරන සිංහ වෙස් මුහුණ බැඳ ගත්තු කපටි නරියා දක්වා විවිධ භූමිකාවන් මේක ඇතුළේ තිබුණා. ඒ වාගේම තමයි ඔයා ආවට අපි ගණන් ගන්නේ නැහැ කියන ආකාරයේ Don't care නළුවොත් හිටියා. ඉතින් මෙවැනි විකට කවට විවිධාකාරයේ නළුවන්ගෙන් සමන්විත නාටකයක් රටේ ජනතාවට නරඹන්න දුන්නා. (බාධා කිරීමක්) දැන් ඔබතුමා දන්නවා මේ විදේශීය බලපෑම් එහෙම නැත්නම් ජාත්‍යන්තර ඇඟිලි ගැසීම් රටට සිදු වන්නේ, අපේ රටේ මානව හිමිකම් කඩකිරීම්, ප්‍රජාතන්ත්‍රවාදය අහෝසි කිරීම් කියන කාරණා නිසා බව.

දැන් නවනීදම් පිල්ලේ නෝනා ආවට පස්සේ උතුරේ හමුදා කඳවුරු හයක් අයින් කරනවා. හොඳයි. ඒ හමුදාව කඳවුර ඇතුළට ගාල් කරනවා. හොඳයි. ඒ වාගේම අර පොලිස් දෙපාර්තමේන්තුව වෙනම අමාත්‍යාංශයක් යටතට ගන්නවා. හොඳයි. මේවා කරන්න පිල්ලේ නෝනා එනකල් ඉන්න ඕනෑ නැහැ. මේ ජනතා විමුක්ති පෙරමුණ යුද්දේ අවසන් වෙලා දවස් හතක් යනකොට ආණ්ඩුවට ලිඛිතව කිව්වා, කරනවා නම් මෙන්න කරන්න කියලා. දැන් මේකෙන් මොකක්ද වෙන්නේ? අපේ රට තුළින් ආපු යෝජනාවලියක් ක්‍රියාත්මක කරන්නේ නැතුව (බාධා කිරීමක්) පිල්ලේ නෝනා ආවට පස්සේ කරනකොට ඔන්න උතුරේ ජනතාවටත් හිතෙනවා, පිල්ලේ නෝනා වැඩි වැඩියෙන් මෙහෙට එනවා නම් හොඳයි කියලා. පිල්ලේ නෝනාට එන්න කිව්වේ, මල් මාල දාලා පිළිගත්තේ, අවුරුදු දෙකකට ඉස්සෙල්ලා එන්න කිව්වේ ආණ්ඩුව. දැන් මේ බොරුවට නිකම් උද්ඝෝෂණ හදලා, බොරුවට මෙහේ විරෝධයක්

[ ගරු නලින්ද ජයතිස්ස]

හදන්න හැදුවාට මේ ආණ්ඩුවේ ඩබල් ගේම් එකෙන්, දෙබිඩි ප්‍රතිපත්තියෙන් හැල්ලු වෙන්නේ ආණ්ඩුව විතරක් නොවෙයි, මේ රටයි. මේ රටයි හැල්ලු වෙන්නේ.

පිල්ලේ නෝනා එනකොට එතුමිය එන්න ආසන්න කාලයේදී රටේ මොකක්ද වුණේ? අර මන්දනා ස්මයිල් අබේවික්‍රම මාධ්‍යවේදිනියකගේ නිවසට පැනලා පැය තුනක් ලිපි ලේඛන හොයලා, ඒක හොර කණ්ඩායමක් කළා කියලා එක නාඩගමක් නැටුවා. ඒවායේ පරීක්ෂණ කෝ? අපි අහන්නේ එකම පවුලේ අය හොරකම් කරනවා නම්, එකම පවුලේ අය කොල්ල කනවා නම් රටේ පරීක්ෂණ කරන්නේ නැද්ද? නීති පොතට එහෙම දාලා තියෙනවාද? එකම පවුලේ අයියා මල්ලි කරනවා නම් පරීක්ෂණ නැත කියලා. ඒකද වෙලා තියෙන්නේ? එතුමිය එන්න ඉස්සෙල්ලා, පසුගිය අගෝස්තු පළමුවැනිදා වැලිවේරියේදී තුන් දෙනෙකුට වෙඩි තියලා ඝාතනය කළා. ඒ විතරක් නොවෙයි. හැට ගණනකට තුවාල සිදු කළා. කෝ පරීක්ෂණ? කාවද අත්අඩංගුවට අරගෙන තියෙන්නේ? කාවද උසාවියට ඉදිරිපත් කරලා තියෙන්නේ? කිසි කෙනෙක් නැහැ. ඒ නිසා රටේ මානව හිමිකම් කඩ වෙලා, ප්‍රජාතන්ත්‍රවාදය අහෝසි කරලා, උතුරේ සිවිල් ක්‍රියාකාරිකයන් පැහැරගෙන, උතුරේ ඡන්දය කරන්න දෙන්නේ නැතුව මෙවැනි දේවල් නිසා තමයි අපේ රටට එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙන්න පුළුවන්, මානව හිමිකම් කොමිෂම වෙන්න පුළුවන්, මේ අය ඇඟිලි ගහන්නේ.

ඒ නිසා අපට පේන්නේ ආණ්ඩුව මේවාට කැමැතියි. ඒක පෙන්නලා තමයි ඡන්දය ගන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා අපි කියන්නේ, වහාම රටේ මානව හිමිකම් ආරක්ෂා කරන්න. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න. එහෙම නැත්නම් මේ වාගේ නෝනලාට නිකම් විකට බස් කියලා, මංගල යෝජනා දාලා මේ රටේ ප්‍රශ්න විසඳන්න බැහැ. තව තවත් රට හැල්ලු කරන එක විතරයි වෙන්නේ. ඒ නිසා මේ නෝනා රටට එරෙහිව වාර්තා ඉදිරිපත් කරන්න පෙර - නවනීදම් පිල්ලේ නෝනා ලබන මාර්තුවේ හරි, සැප්තැම්බර්වල හරි මේ රටට විරුද්ධව යම් වාර්තාවක් ඉදිරිපත් කළොත් ඒ වගකීම 90% ක් ආණ්ඩුව භාර ගන්න ඕනෑ. නිකම් මේවා ඉදිරිපත් වෙන්නේ නැහැ. සිදුවීම් එක්කයි ඉදිරිපත් වෙන්නේ. උතුරේ ජනතාවට ඡන්දය කරන්න බැරි වනකොට, උතුරේ දේශපාලන පක්ෂවලට ඡන්දය කරන්න බැරි වනකොට, මේ රටේ මාධ්‍යවේදීන් ඝාතනය කරනකොට මාධ්‍ය ආයතන ගිනි තියනකොට, ඒ විතරක් නොවෙයි,

**ගරු ලලිත් එල්ලාවල**
**Hon. Lalith Ellawala**

JVP එකෙන්ද කළේ?

**ගරු නලින්ද ජයතිස්ස**
**Hon. Nalinda Jayathissa**

වෘත්තීය සමිති ක්‍රියාකාරිකයින් තර්ජනය කරනකොට මේවා තමයි විදේශ බලපෑම්වලට, විදේශ මැදිහත්වීම්වලට අතදාන්න ලැබෙන පාර.

**ගරු ලලිත් එල්ලාවල**
**Hon. Lalith Ellawala**

88 – 89 කාලේ මානව හිමිකම් තිබුණේ නැද්ද?

**ගරු නලින්ද ජයතිස්ස**
**Hon. Nalinda Jayathissa**

ඒකයි අපි වහන්න ඕනෑ. ඒ නිසා මේ රටේ ජනතාවට -

**ගරු සභාපතිතුමා**
**Mr. Chairman**

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නලින්ද ජයතිස්ස**
**Hon. Nalinda Jayathissa**

මේ අධිරාජ්‍යවාදී මැදිහත්වීමට විරුද්ධ වෙනවා වාගේම ආණ්ඩුවේ මේ ප්‍රජාතන්ත්‍ර විරෝධී මානව හිමිකම් කඩ කිරීම්වලට එරෙහි වෙන්න සියලු දෙනාටම වගකීමක් තිබෙනවා. මොකක්ද?

**ගරු ලලිත් එල්ලාවල**
**Hon. Lalith Ellawala**

බස් ගිනි තියන කොට, හාමුදුරුවරු මරණ කොට මානව හිමිකම් මතක් වුණේ නැද්ද?

**ගරු සභාපතිතුමා**
**Mr. Chairman**

ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
**Hon. Nalinda Jayathissa**

එදා එතකොට කවුද ජීනීවා ගියේ?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

89 – 91 දී

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

එතකොට කවුද එහේ ගිහිල්ලා explain කළේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

JVP එකයි UNP එකයි එකතු වෙලා මැරුවේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒ නිසා ගෙන්වා ගැනීම පිළිබඳව අපි විරුද්ධ වෙනවා කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

# පළාත් සභාවේ රැස්වීම
PROVINCIAL COUNCIL MEETING

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, *"2013.08.19 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී එළඹුණු එකඟතාවයට අනුව අද දින 2013.09.03 දින විසිර යෑමෙන් අනතුරුව මෙම සභාව 2013.09.24 දින පෙ.ව. 9.30 ට රැස්විය යුතු අතර 2013.09.17 වන අඟහරුවාදා දින සභා රැස්වීම් නොපැවැත්වෙන දිනයක් ලෙස සලකා ක්‍රියා කළ යුතුය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් විධියට මම පුවත්පත් දැන්වීම් දෙකක පළ වෙලා තිබෙන කාරණා සම්බන්ධයෙන් මේ පළාත් සභාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඉස්සෙල්ලාම ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ පුවත්පත් දෙකේ තිබෙන කාරණා. මන්ත්‍රීවරු සම්බන්ධයෙන් තියෙන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය මට කියන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

කවුද කියලා නමක් නැති නිසා තමයි අපේ වරප්‍රසාද කඩ වෙලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකත් කියලා ඔබතුමා සභාගත කරන්න. දිගින් දිගට විස්තර කථා කරන්න යන්න එපා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

දැන් එකක් තමයි මේ පුවත්පතේ තිබෙනවා මන්ත්‍රීවරයෙකුට බෙදන්න පරිසර අධිකාරියෙන් භාර දීපු කුණු කසළ බඳුන් විශාල ප්‍රමාණයක් වහල උඩ තිබෙනවා කියලා. මේක දීලා තිබෙන්නේ 2011 දී. ඉතින් මේ මහජනතාවට බෙදන්න දීපු කසළ බඳුන් (බාධා කිරීම්) බස්නාහිර පළාත් සභාවේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා, පුවත්පතේ දිනය කියන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අගෝස්තු 13 වැනිදා.

**ගරු නෙලුක් මල්ලව**
Hon. Neluk Mallawa

ඊට පස්සේ සභාවක් තිබුණා නේ?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

අපට ඕනෑ වෙලාවට අපි කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා කරුණාකරලා ඔබතුමා මට පුවත්පතේ දිනය නිවැරැදිව කියන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

2013 අගෝස්තු මස 13 වැනිදා. ගරු සභාපතිතුමා ඔබතුමා දැන් හරි හොඳයි. හරි ෂෝක් එකට කරනවා. අනෙක් එක තමයි මේ අගෝස්තු මස 24 වැනිදා ලංකාදීප පත්තරේ තිබෙනවා ලක්ෂ පහක වංචාවකට බස්නාහිර පළාත් සභා මන්ත්‍රී අල්ලා ගැනීමට සොයයි කියලා. මේ කවුද කියලයි අපට දැනගන්න ඕනෑ. මේකේ තිබෙනවා මීගමුව දිසා වංචා විමර්ශන අංශය පුළුල් පරීක්ෂණයක් පවත්වාගෙන යනවා කියලා. ඒ නිසා මේක මන්ත්‍රීවරු හැටියට නම නැති වුණාම, සියලුම මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩ කිරීමක්. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමා මේ සභාව දැනුවත් කරන්න. මෙහෙම කරන්න එපාය කියලා අදාළ පුද්ගලයන්ට දැනුම් දීමක් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පුවත්පත් දෙක සභාගත කරන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, ඇත්තටම මේක බරපතළ ප්‍රශ්නයක්. මොකද, මන්ත්‍රීවරයෙක් කවුරු හරි එහෙම ඉන්නවා නම් ඔහුගේ නමත් එක්ක සඳහන් වෙනවා නම් අපට ගැටළුවක් නැහැ. මේ සභාව නියෝජනය කරන සෑම ගරු මන්ත්‍රීවරයෙකුටම මේක ප්‍රශ්නයක්. මොකද, මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා කිරීමට අපි සියලු දෙනාම බැඳී සිටිනවා. යම්කිසි කෙනෙකුට චෝදනාවක් තිබෙනවා නම් ඒ චෝදනාවත් එක්ක නම සඳහන් වුණාම කිසිම ගැටළුවක් නැහැ. අපි දැක්කා, ඇතැම් අවස්ථාවල ඉතාම පහත් ලෙස මාධ්‍ය භාවිතා කරනවා. අපි කරුණාකරලා ඉල්ලා සිටිනවා එවැනි ආකාරයට හැසිරෙන්න එපා. මම දැක්කා කොළඹ නගර සභාවේ විවාදයකදී නාගරික මන්ත්‍රීවරයෙකුගේ දත් කුට්ටම හැළීම රවුම් කර කර මන්ත්‍රීවරයාව පෙන්වනවා. හරිම අශෝභනයි. ඒක මන්ත්‍රීවරයාගේ හැසිරීමේ ප්‍රශ්නයක් නොවෙයි. විවාදයක් ඇති වුණු අවස්ථාවේදී මන්ත්‍රීවරයාගේ දත් කුට්ටම වැටෙනවා. එතකොට ඒක රවුම් කර කර පෙන්වනවා. හැබැයි, ඊට පහුවදාම පෙන්වනවා කෝටි දෙකක කුඩු අල්ලලා. දකුණු ආසියාවේ විශාලම කුඩු ඇල්ලීම. හැබැයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, පැහැදිලියි.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

කුඩු කාරයාගේ මුහුණ Blurred කරනවා. මේ මොන සදාචාරයක්ද කියන එක ප්‍රශ්නයක්. කුඩුකාරයාගේ මුහුණ Blurred කරනවා. අර මන්ත්‍රීවරයාගේ දත් කුට්ටම හැලුනු එක රවුම් කරලා තුන් පාරක් පෙන්වනවා. මම කියන්නේ මේක කාටවත් වෙන් වෙන්ම නොවෙයි. දේශපාලන අධිකාරියේ සියලුම දෙනාට, පක්ෂ භේදයකින් තොරව සියලු දෙනාටම බලපාන ප්‍රශ්නයක්. ඒ නිසා මම කියන්නේ රටේම නොවෙයි, අඩු ගණනේ බස්නාහිර පළාතේ මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා කර ගැනීම සඳහා ඔබතුමා යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න ඕනෑ. මෙවැනි පහත් තත්ත්වයට ඇතැම් මාධ්‍ය - මම සියලු දෙනාට කියන්නේ නැහැ. ඇතැම් අංශ කනගාටුදායක ලෙස මේ වාගේ හැසිරෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු විපක්ෂ නායකතුමාත්, ඒ වාගේම අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් ඉතාමත්ම වැදගත් කාරණාවක් පිළිබඳව සභාව දැනුවත් කළා. මොකද, බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරුන් සම්බන්ධ කාරණාවක්. ඒ නිසා මේ අවස්ථාවට සම්බන්ධ වී සිටින ඒ මාධ්‍යවේදීන්ගෙන් මම ඉල්ලා සිටිනවා, හැකිතාක් දුරට ඔබගේ මාධ්‍ය ආයතනය දැනුවත් කරන්න. මම හිතනවා, ඒ නම් සඳහන් කරලා ඒ වාර්තාව ලියනවා නම් එහෙම, ඒක ගරු මන්ත්‍රීවරුන්ට කරන සාධාරණය ඉෂ්ට කිරීමක් වශයෙන් මම දකිනවා. ඒ නිසා කරුණාකර ඉදිරියේදී ඒ වාගේ ප්‍රකාශ කරන කොට, ප්‍රවෘත්තිය සඳහන් කරන කොට ඒ නම සඳහන් කරලා ලිව්වත් කිසිම ප්‍රශ්නයක් නැහැ.

මොකද, එහෙම සඳහන් කිරීමේදී අනික් මන්ත්‍රීවරුන්ට හානියක් වෙන්නේ නැහැ.

# පළාත් සභාවේ කටයුතු
# PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු ජගත් අංගගේ -**අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, *"අද දින (2013.09.03) න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ ඇති කාර්යයන්හි අනුපිළිවෙළ පිළිවෙළින් අංක 06, 07, 01, 02, 03, 04 හා 05 වන පරිදි සංශෝධනය විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ එකඟතාවය අනුව පොදු කටයුතු විෂයෙහි කාර්ය අනුපිළිවෙළෙහි සුළු සංශෝධනයක් සිදු වෙනවා. ඒ අනුව ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවස්ථාව න්‍යාය පත්‍රයේ අංක 06 යටතේ සඳහන් යෝජනාව ඉදිරිපත් කිරීමට.

# ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා : අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
# BY-LAWS ON CREMATORIUMS : ATTANAGALLA PRADESHIYA SABHA

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

ගරු සභාපතිතුමනි, *"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(**xiv**) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 122 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, අත්තනගල්ල ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද, "අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ, ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා" නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,*

*1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123(1) වගන්තිය යටතේ, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලි බල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර,*

*එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1788/8, දරන, 2012 දෙසැම්බර් මස 11 වැනි දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදුන අතර,*

*එකී අතුරු ව්‍යවස්ථාවනට අවසර නොදීම නොකරන ලෙසට, යෝජනා කරමින්ම එම අතුරු ව්‍යවස්ථාවන්, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 125 වන වගන්තිය යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි. "*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සම්බන්ධයෙන් සභාවේ -

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව අපට අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුළුවන්. ඔබතුමා සියලු යෝජනා අවසානයේදී කෙටියෙන් අදහස් ප්‍රකාශ කරන්න.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

එම යෝජනා ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්න සභාභිමුඛ කරන ලදී.***
*Questions proposed*

## කුළී ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා : කඩුවෙල මහ නගර සභාව

BY-LAWS ON PARKING OF TRISHAW TAXIES: KADUWELA MUNICIPAL COUNCIL

ගරු සභාපතිතුමනි, *"252 වන අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියේ (1) උප වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 272 වන වගන්තියේ 32 උප වගන්තිය යටතේ කඩුවෙල මහ නගර සභාව විසින් සාදන ලද කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ කුළී ත්‍රී රෝද රථ නවතා තැබීම, විධිමත් කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා" නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,*

*1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ (2) වන වගන්තියේ (1) වන උප වගන්තිය සමඟ කියවිය යුතු වූ 252 අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 268 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලි බල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර,*

*එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1788/8 දරන 2012 දෙසැම්බර් මස 11 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදුන අතර, එකී අතුරු ව්‍යවස්ථාවන් ස්ථිර කරන ලෙසට යෝජනා කර සිටිමින්ම එම අතුරු ව්‍යවස්ථාවන්, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 268 වන උප වගන්තිය යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි."*

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**
*Question proposed*

## ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා : කළුතර ප්‍රාදේශීය සභාව

BY-LAWS ON PARKING OF TRISHAWS: KALUTARA PRADESHIYA SABHA

ගරු සභාපතිතුමනි, *"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තිය යටතේ කළුතර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද කළුතර ප්‍රාදේශීය සභාවේ - "ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා" නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,*

*1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වගන්තිය යටතේ, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර,*

*එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1725/16 දරන හා 2011.09.29 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදුන අතර,*

*එකී අතුරු ව්‍යවස්ථාවනට අවසර නොදීම නොකරන ලෙසට යෝජනා කරමින්ම එම අතුරු ව්‍යවස්ථාවන්, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 125 වන වගන්තිය යටතේ* ***2013.06.18*** *දින, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, තවදුරටත් ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී සාකච්ඡා කර එම කාරක සභාව විසින්, තම නිර්දේශයන්ද ලබා දී ඇති හෙයින් එම නිර්දේශයන් පිළිබඳවද සැලකිලිමත්ව ක්‍රියා කළ යුතුය."*

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**
*Question proposed*

## නගර සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

BY-LAWS ON PARKING OF VEHICLES WITHIN URBAN COUNCIL LIMITS

ගරු සභාපතිතුමනි, *"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියෙහි පළමුවන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1725/16 දරන 2011 සැප්තැම්බර් 29 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද,*

*නගර සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,*

*1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේම 3 වන උප වගන්තිය යටතේ 2013.06.18 දින අනුමැතිය සඳහා මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තවදුරටත් ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී සාකච්ඡා කර එම කාරක සභාව විසින් තම නිර්දේශයන්ද ලබා දී ඇති හෙයින් එම නිර්දේශයන් පිළිබඳවද සැලකිලිමත්ව ක්‍රියා කළ යුතුය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

## ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
BY-LAWS ON PARKING OF VEHICLES WITHIN PRADESHIYA SABHA LIMITS

ගරු සභාපතිතුමනි, *"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තියෙහි පළමුවන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1725/16 දරන 2011 සැප්තැම්බර් 29 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද,*

*ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,*

*1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේම 3 වන උප වගන්තිය යටතේ 2013.06.18 දින අනුමැතිය සඳහා මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තවදුරටත් ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී සාකච්ඡා කර එම කාරක සභාව විසින් සිය නිර්දේශයන්ද ලබා දී ඇති හෙයින් එම නිර්දේශයන් පිළිබඳවද සැලකිලිමත්ව ක්‍රියා කළ යුතුය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

## ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව : පානදුර නගර සභාව
BY-LAWS ON PARKING OF TRISHAWS: PANADURA URBAN COUNCIL

ගරු සභාපතිතුමනි, *"255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 157 (14 අ) වන උප වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 153 වන වගන්තිය යටතේ පානදුර නගර සභාව විසින් සාදන ලද පානදුර නගර සභාවේ - "ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා" නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,*

*1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු වූ 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 154 වගන්තිය යටතේ, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර,*

*එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1783/39 දරන 2012 නොවැම්බර් මස 09 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදුන අතර,*

*එකී අතුරු ව්‍යවස්ථාවනට අවසර නොදීම නොකරන ලෙසට යෝජනා කර සිටිමින්ම එම අතුරු ව්‍යවස්ථාවන්, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 156 වන වගන්තිය යටතේ 2013.06.18 දින අනුමැතිය සඳහා මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තවදුරටත්*

*ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී සාකච්ඡා කර එම කාරක සභාව විසින් තම නිර්දේශයන්ද ලබා දී ඇති හෙයින් එම නිර්දේශයන් පිළිබඳවද සැලකිලිමත්ව ක්‍රියා කළ යුතුය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා යෝජනා 06 ක් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමාට දැන් අවස්ථාව ලබා දෙන්න පුළුවන්.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තූතිවන්ත වන ගමන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරිපත් කරපු කාරණා 06 සම්බන්ධයෙන් අත්තනගල්ල ආදාහනාගාරය පිළිබඳ යෝජනාව හැර අනෙකුත් යෝජනා සියල්ල පළාත් පාලන ආයතන සම්බන්ධ යෝජනාවන් පළාත් පාලන ආයතනවල ආදායම වර්ධනය කරන්නයි, මේ අතුරු ව්‍යවස්ථා සංශෝධනය වෙන්නේ. විශේෂයෙන්ම, ඒ ආදායම් වර්ධනය වීම සම්බන්ධව. මේ ආදායම් පිළිබඳව මීට කලිනුත් සාකච්ඡා කරන අවස්ථාවලදී කිව්වා. මේ ආදායම මොකක්ද කියන එක ගණනය කරන්න විධියකුත් නැහැ. බලන්න විධියකුත් නැහැ. පළාත් පාලන ආයතනවල වාර්තාවක් ඇත්තෙත් නැහැයි කියලා. පොදුවේ සමස්තයක් හැටියට ගත්තාම. ඒ නිසා විශේෂයෙන් මම කළුතර ගැන කථා කළා පසුගිය වතාවේත්. කළුතර නාගොඩ රෝහල ඉදිරිපිට පෞද්ගලික ඉඩමක මේ ත්‍රීරෝද රථ නැවැත්වීමේ නවාතැන් පොළක් හදාගෙන ඒකේ මුදල් අය කරනවා. ඒක සභාවට අයිති ඉඩමක් නොවෙයි. බලහත්කාරයෙන් කර ගෙන යනවා. ඒ ආදායම් කොහාට යනවාද කියලා අපි දන්නේ නැහැ. ඒ වාගේ සමස්තයක් හැටියට ගත්තාට පස්සේ අද පළාත් පාලන ආයතනවලට විවිධ මාදිලියේ අංශවලින්, මග නැගුම, ඒ වාගේම විමධ්‍යගත, පළාත් සභා මුදලින් සංවර්ධනයට විශාල මුදලක් ලැබෙනවා. එහෙම නම් මේ සභාවලට අයිති වන, සභාවේ උපයාගන්නා වූ ආදායම්වලට මොනවාද වෙන්නේ කියන එක අද ලොකු ගැටළුවක්. ඒ පිළිබඳව කිසිම තොරතුරක් අද ලබා ගන්න විධියක් නැහැ. විගණනයට පවා එන්නේ නැහැ. ඒ වාර්තාව පළාත් සභාවට එන්නෙත් නැහැ. ගරු සභාපතිතුමනි, මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කරන්නේ. ඉතින් මේ නිසා සභාවෙන්, නැත්නම් ප්‍රධාන අමාත්‍යාංශයෙන්, අනෙකුත් අමාත්‍යාංශවලින් ලබා දෙන මේ මුදල් හැර පළාත් පාලන ආයතනවලින් උපයා ගන්නා මුදල් පිළිබඳව මේ සභාවට වාර්තා වෙන්න ඕනැ. පසුගිය වසර තුනක කාලයේ ඒවා පිළිබඳවත් මේ සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන්න පුළුවන් නම් යෝග්‍යයි කියලා මම ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යෝජනා කරන්න කැමැතියි.

ඒ එක්කම මේ පිළිබඳව අධීක්ෂණයක් අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ අය හිතුවක්කාර විධියට සේවකයෝ බඳවා ගන්නවා. ඒවා ඒ සභාවේ ආදායමින් ගෙවනවා. සභාවේ යම් යම් භාණ්ඩ මිලදී ගැනීම් කරනවා. ඒ හිතුවක්කාර පාලනයක් බොහෝ දුරට තිබෙන්නේ. ඒ නිසා මෙක ජනතාවට, නැත්නම් බදු ගෙවන ජනතාවටවත් කිසිම සහනයක් ලැබෙන්නේ නැති නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මේ යෝජනාවට විරුද්ධ නැහැ. නමුත් විශේෂයෙන්ම අධීක්ෂණ කටයුතු මීට වඩා - ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මම යෝජනා කරනවා. අධීක්ෂණ කටයුතු මීට වඩා සොයා බැලීමක් කරන්නත්, ඒ වාගේම අපි බස්නාහිර පළාත් සභාවෙන් පළාත් පාලන ආයතනවලට ලබා දෙන ප්‍රතිපාදන පිළිබඳව කිසිම විගණන වාර්තාවක් මේ සභාවට ලබා ගන්න අපට ක්‍රමයක් නැහැ. වහාම මේ පිළිබඳවත් අවධානය යොමු කරලා, මේ පළාත් පාලන ආයතන පිළිබඳව දැඩි අවධානය යොමු කරන්නය කියන එක මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, අත්තනගල්ල ප්‍රාදේශීය සභාව විසින් ඉදිරිපත් කරන ලද ආදාහනාගාරය පිළිබඳ යෝජනාව සම්බන්ධයෙන් අදහසක් ප්‍රකාශ කරන කොට පළාත් පාලන ආයතනවල ආදාහනාගාර සේවාව ඇත්තෙන්ම ඒ ප්‍රදේශයේ ජනයා වෙනුවෙන් සේවාවක් විධියට පවත්වාගෙන යනවා නම් ඉතාම හොඳයි. අපි දන්නවා, එක ළඟ තිබෙන පළාත් පාලන ආයතන දෙකක ගත්තත් මුදල් අය කිරීම පිළිබඳව විශාල ගැටළු මතු වෙනවා. දැන් මම දන්න එක පළාත් පාලන ආයතනයක් තිබෙනවා. තමන්ගේ කොට්ඨාශය ඇතුළත දේහයක් ආදාහනය කරන්න රු. 7000/- ක් විතර ගන්නවා. ඒ එක්කම අනික් පැත්තේ තිබෙන ප්‍රාදේශීය සභාවෙන් ගන්නේ රු. 5000/- යි. එතකොට රු. 1000/- ක් බස් එකට වියදම් කරලා අල්ලපු ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයට ගෙනාවත් ලාභයි. ඒ නිසා මම හිතන්නේ, අපේ පළාත් පාලන ආයතන ප්‍රධානීන් කල්පනා කරනවා නම්, මනුස්සයෙක් මළාම තමයි ඒ පවුල ඉතාම දුර්වල,

අසරණ තත්ත්වයකට පත් වෙන්නේ. සල්ලි තිබෙන මිනිහෙකුට මේ පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. අද ගම්වල තිබෙන ග්‍රාමීය මට්ටමේ - තවමත් හිතවත්කමට, වළක් කපලා දෙන එක කරන එක තවම තිබෙනවා. නමුත් එන්න එන්න නාගරිකකරණය වෙමින් යද්දී මේ සාමාජීය තත්ත්වය ඉතාම දුර්වල මට්ටමකට වැටිලා තිබෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ අපේ ප්‍රධාන අමාත්‍යවරයා හරහා යම් නියාමනයක් මේ මුදල් අය කිරීම සම්බන්ධයෙන් කරනවා නම් හොඳයි කියන එක මම කල්පනා කරන්න කැමැතියි. මොකද, පළාත් පාලන ආයතනයක් තමන් උපරිම ලාභ ලැබිය යුත්තේ මේකෙන් කියලා කල්පනා කරලා මේකේ ගණන වැඩි කළ යුතුයි කියනවා නම් ඒක සේවාවක් වෙන්නේ නැහැ. ඒක ලාභදායී ව්‍යාපාරයක් බවට පත් වෙනවා. ඒ නිසා පළාත් පාලන ක්ෂේත්‍රය තුළ ජනයා බලාපොරොත්තු වන අරමුණ නොවෙයි ඒකෙන් ඉෂ්ට වෙන්නේ. නමුත් අර යන වියදම ඒකෙන් උපයාගත යුතුයි. නමුත් ලාභය පිළිබඳව මීට වැඩිය කල්පනා කරනවා නම් හොඳයි කියන එක මම මතක් කරන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම යෝජනා පිළිබඳව ගරු විපක්ෂ නායකතුමාත්, ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමාත් ඉතාමත් වැදගත්ම අදහස් කිහිපයක් ප්‍රකාශ කළා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒ පිළිබඳවත් ඔබතුමාගේ සැලකිල්ලට යොමු කරනවා.

ඒ අනුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද න්‍යාය පත්‍රයේ පොදු කටයුතු යටතේ අංක 06, 07, 01, 02, 03 හා 04 යෝජනාවන් සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසනවා.

***ඊට අනුකූලව න්‍යාය පත්‍රයේ අංක 06 පිළිබඳව ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
*Accordingly, having raised the question No. 06 of the Agenda, it was adopted.*

***ඊට අනුකූලව න්‍යාය පත්‍රයේ අංක 07 පිළිබඳව ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
*Accordingly, having raised the question No. 07 of the Agenda, it was adopted.*

***ඊට අනුකූලව න්‍යාය පත්‍රයේ අංක 01 පිළිබඳව ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
*Accordingly, having raised the question No. 01 of the Agenda, it was adopted.*

***ඊට අනුකූලව න්‍යාය පත්‍රයේ අංක 02 පිළිබඳව ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
*Accordingly, having raised the question No. 02 of the Agenda, it was adopted.*

***ඊට අනුකූලව න්‍යාය පත්‍රයේ අංක 03 පිළිබඳව ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
*Accordingly, having raised the question No. 03 of the Agenda, it was adopted.*

***ඊට අනුකූලව න්‍යාය පත්‍රයේ අංක 04 පිළිබඳව ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
*Accordingly, having raised the question No. 04 of the Agenda, it was adopted.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදිකිරීම්, ධීවර හා සංචාරක කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමාට අවස්ථාව 2013 අංක ... දරන බස්නාහිර පළාතේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරී (සංශෝධන) ප්‍රඥප්තිය දෙවන වර කියවීමේ වැඩ කටයුතු ආරම්භ කිරීමට අවස්ථාව.

**ගරු නිමල් ලාන්සා** (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා)
Hon. Nimal Lansa - (Minister of Road Development, Animal Production and Development, Housing and Construction, Fisheries and Tourism)

ගරු සභාපතිතුමනි, යෝජනාව ඊළඟ සභාවට ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යෝජනාව ඊළඟ සභාවට ඉදිරිපත් කිරීමට සභාවේ අවසරය ගරු අමාත්‍යතුමා ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව ඊට එකඟ බව පවසන බැවින්, යෝජනාව ඊළඟ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලෙස දැනුම් දෙනවා.

න්‍යාය පත්‍රය අනුව මීළඟට තිබෙන්නේ පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු. මුලින්ම අංක 01 ට තිබෙන්නේ, සිරිකමල් පිලිෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, පෞද්ගලික මන්ත්‍රී යෝජනා සියල්ල ඊළඟ සභා වාරයේදී සාකච්ඡාවට ගැනීමට යෝජනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් යෝජනා කළා පෞද්ගලික මන්ත්‍රී යෝජනාවන් ඊළඟ සභාවට ඉදිරිපත් කරන ලෙසට. සභාවේ එකඟතාවය?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් එකී යෝජනාවන් ඊළඟ රැස්වීමට යොමු වෙනවා. සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට ගරු සභානායකතුමාට හෝ ගරු අමාත්‍යවරයෙකුට අවස්ථාව ලබා දෙනවා.

# කල් තැබීමේ යෝජනාව
## ADJOURNMENT

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු අමාත්‍යතුමා)
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industries and Environmental Affairs.)

ගරු සභාපතිතුමනි, "දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි" මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව පූ.භා. 10.28 ට, 2013 සැප්තැම්බර් මස 24 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at* 10.28 *a.m till 9.30 a.m. on* 24.09.2013